# ශ්‍රී ලංකා-එ.ජ. පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ යළි ආරම්භ කිරීමේ අවස්ථාවෙහි දැක්වූ අදහස්
# 2023 පෙබරවාරි 23 වැනි දා, බ්‍රහස්පතින්දා, ප.ව.2.30
# පාර්ලිමේන්තුව, කාරක සභා කාමර අංක 2

ගරු කථානායකතුමනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, ශ්‍රී ලංකා-එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය නැවත ආරම්භ කිරීමට අද දින ඔබ සැම සමගින් පාර්ලිමේන්තුවේදී සම්බන්ධ වන්නට ලැබීම ගැන මා සතුටු වනවා. මේ වැදගත් සංගමයට නැවතත් ජීවය දීම සඳහා මුල පිරූ ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමාට මා විශේෂයෙන් ස්තුති කරන්නට කැමතියි, එමෙන්ම, විවිධ පක්ෂවලින් මීට සම්බන්ධවීමට උනන්දුව දක්වන බොහෝ මන්ත්‍රීවරුන්ටත් මා ස්තුති කරනවා.

අප දෙරට අතරේ 75 වසරක ද්වීපාර්ශවීය සබඳතා සමරන මේ වර්ෂයේ දී මෙම සංගමය නැවතත් ආරම්භ කරන්නට යෙදීම විශේෂයෙන්ම උචිතයි. ආරම්භයේ සිටම අපේ සම්බන්ධතාවයට පදනම වූයේ අපගේ පොදු වටිනාකම්, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට අපේ ඇති ගැඹුරු කැපවීම, මෙන්ම ව්‍යාපාර අංශය, අධ්‍යාපනය, කලාව හා සංස්කෘතියත් ඉන් ඔබ්බටත් මිනිසුන් අතරේ ඇති ඒ අද්විතීය සම්බන්ධතාවයයි.

ශ්‍රී ලංකාවේ නිපදවන භාණ්ඩ සඳහා අංක 1 ගමනාන්තය එක්සත් ජනපදය වීම ගැන මා ආඩම්බර වනවා. එමෙන්ම, 70 වසරක ශක්තිය සමගින් ක්‍රියාත්මක වන එ.ජ.-ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිසම, සහ ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා මෑතකදී අප තිළිණ කළ වෙරළාරක්ෂක යාත්‍රාව ඇතුළුව අපගේ හමුදාවන් අතරේ පුහුණු හුවමාරුව සහ හවුල්කාරීත්වය වැනි අප එක්ව වැඩකරන අනෙකුත් සියළුම ආකාර සම්බන්ධයෙන් ද මා ආඩම්බර වනවා. 75 වසරක් මුළුල්ලේ එක්සත් ජනපදයත්



SENSITIVE BUT UNCLASSIFIED

ශ්‍රී ලංකාවත් ජනතාව, ප්‍රගතිය සහ හවුල්කාරීත්වය පදනම් කරගෙන සම්බන්ධතාවයක් ගොඩ නංවා තිබෙනවා.

පසුගිය වසර මුළුල්ලේ ඇමෙරිකානු ජනතාව මේ අර්බුද සමයේ ශ්‍රී ලාංකීය ජනතාවට සහය ලබාදීම පිණිස ඉදිරියට පැමිණියා. ගිය වසරේ පමණක් අප පාසැල්වල දිවා ආහාර, ගොවීන්ට පොහොර, ගර්භණී මවුවරුන් සහ ළමුන් සඳහා පෝෂණ සහය යනාදිය සඳහා නව ආධාර වශයෙන් ඇ. ඩොලර් මිලියන 270ක් නිවේදනය කළා. අවශ්‍යතා ඇති අය වෙත මෙම ආධාර ළඟාවන බව සහතික කරගැනීම මට ඉතා වැදගත් ප්‍රමුඛතාවයක්.  ඔබ නියෝජනය කරන ජනතාවට උපකාර කිරීම සඳහා එයින් පිටුවහලක් ලැබෙන්නට ඇතැයි මා බලාපොරොත්තු වනවා.

මේ අභියෝගාත්මක කාලයක් කියා මා දන්නවා, නමුත් මෙය බලාපොරොත්තුව සහ අවස්ථාවන් සහිත කාලයක් ද වනවා. එක්ව ඔබ ඔබේ රටේ අනාගතය ලියාවි. එය පහසු දෙයක් නොවෙතත් ඔබේ කැපවීම සහ කාර්යයන් මා අගය කරන බව ඔබට කියන්න කැමතියි.

අපේ රටවල්වලට පොදු ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවල හදවත වන්නේ ස්වාධීන ව්‍යවස්ථාදායක ශාඛාවකුයි. එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව යන දෙරටම සංවරණ හා තුලන පද්ධතීන් ඇති අතර, මහජනයාට සේවය කිරීමේ, විවෘත සාකච්ඡා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුත් තීරණ ගැනීම පෝෂණය කරන, සහ රජයේ අනෙකුත් ආයතන අධීක්ෂණය කිරීමේ අරමුණ සහිත ජාතික ව්‍යවස්ථාදායකයකට හිමිකම් කියනවා.



SENSITIVE BUT UNCLASSIFIED

මන්ත්‍රීවරුන් අතරේ සහ මන්ත්‍රීවරුන් සහ රජය අතරේ නිතරම උණුසුම් තර්ක විතර්ක ඇතිවන පාර්ලිමේන්තුවේ එදිනෙදා වැඩ කටයුතු දෙස පිටත සිට බලන කෙනෙකුට ඇතැම්විටක කලබලකාරී සහ ව්‍යාකූල බවක් පෙනෙන්නට ඉඩ තිබෙන බව මා දන්නවා. එක්සත් ජනපද කොංග්‍රසයේ සහ විවිධ ප්‍රාන්ත හා ප්‍රාදේශීය ව්‍යවස්ථාදායකවල තත්වය සැබැවින්ම එසේමයි. නමුත් ඉතාමත් මතභේදකාරී විය හැකි ගැටළු සම්බන්ධයෙන් කෙරෙන එවැනි සියළුම උණුසුම් වාද විවාද සහ ප්‍රශ්න කිරීම් සියළුම අදහස් පල කිරීම සඳහා අවස්ථාව ලබාදෙමින් රජය නොකඩවා ජනතා අභිමතය පිළිබිඹු කරන බව සහතික කරගැනීම සඳහා වැදගත් වනවා.

අපගේ පොදු ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට අමතරව, එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව වගකිවයුතු ආයතන ගොඩනැගීම, සියලු ප්‍රජාවන් සඳහා දේශපාලන නියෝජනය සහතික කිරීම සහ සැමට සමෘද්ධිමත් අනාගතයක් ගොඩනැගීම සඳහා ආර්ථික අවස්ථාවක් නිර්මාණය කිරීම වැනි බොහෝ පොදු අරමුණු තිබෙනවා. ශ්‍රී ලංකාව සමගින් අපේ ඇති සබඳතාව විවිධ පැතිකඩ සහිත, වෙළඳාම සහ ආයෝජන, අධ්‍යාපන සහ අනෙකුත් හුවමාරු මෙන්ම සංවර්ධන ආධාර ඇතුළත් වන්නා වූ, මේ අරමුණු සාක්ෂාත් කරගන්නට උදවු කිරීම අරමුණු කරගත් සබඳතාවයක්. මෙය, ශ්‍රී ලංකා ඉතිහාසයේ මුහුණ දෙන විශාලතම අභියෝගය විය හැකි අභියෝගයට මුහුණ දෙන මේ අවස්ථාවේ වඩාත් වැදගත් වනවා. මත්ද්‍රව්‍ය ජාවාරම් සහ පුද්ගල ජාවාරම්, දේශගුණික විපර්යාස වැනි ගෝලීය ගැටලු වැනි කලාපීය ආරක්ෂක අභියෝගවලට මුහුණ දීමට ද අප දෙරට  සහයෝගයෙන් කටයුතු කරනවා.



SENSITIVE BUT UNCLASSIFIED

එ.ජ.-ශ්‍රී ලංකා සම්බන්ධතාවල සෑම පැතිකඩක් සඳහාම පාර්ලිමේන්තුව ඉතා වැදගත් වනවා. පාර්ලිමේන්තුව සමගින් ඇති සෘජු සම්බන්ධතාවය අපට ඉතාමත් අගනා දෙයක්. 2015 පටන්.. හරහා මෙම ව්‍යවස්ථාදායකය එ.ජ. රජය සමගින් පවත්වාගෙන ඇති සහයෝගීතාවය ගැන මා ආඩම්බර වෙනවා. ඉන් ලැබූ ජයග්‍රහණ කිහිපයක් මා සඳහන් කරන්නම්: USAID සහායට ස්තූතිවන්ත වන්නට, පාර්ලිමේන්තුවට පූර්ණ ක්‍රියාකාරී මාධ්‍ය මධ්‍යස්ථානයක් සහ ලේඛන මිලියන තුනකට අධික ලේඛනාගාරයක් ඇති අතර, එහි ව්‍යාප්තිය සහ පර්යේෂණ හැකියාවන් ඉහළ ගොස් තිබෙනවා. මීට අමතරව, මහජන සබඳතා සඳහා ද ඇතුළුව පාර්ලිමේන්තු කටයුතු ශක්තිමත් කිරීම සඳහා කාරකසභා කාමරවලට නව ශ්‍රව්‍ය-වීඩියෝ/දෘශ්‍ය උපකරණ ලබාදීම සඳහා USAID සහාය ලබා දී තිබෙනවා. පාර්ලිමේන්තුව දැනට ප්‍රතිසංවිධානය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින ආංශික අධීක්ෂණ කාරකසභා පිහිටුවීම සඳහා ද USAID සහාය ලබා දී ඇති බව මට දැනගන්නට ලැබුණා.  පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ විශ්ලේෂණ කිරීමට සහ ප්‍රමුඛතා සැකසීමට ඇති හැකියාව වැඩි කරන වැදගත් පියවරක් වන අතුරු පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවීමට සහය දැක්වීම ගැන අපි ඉතා සතුටු වනවා.

මහජන යහපත තකා ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ එක් කුළුණක් වන පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමට මේ සහයෝගීතාවය අඛණ්ඩව පවත්වාගෙන යෑමට උනන්දුවෙන් පසු වනවා. පාර්ලිමේන්තුව සහ එ.ජ. කොංග්‍රසය අතරේ චාරිකා සහ හුවමාරු නැවතත් ආරම්භ කිරීමට අපි උද්යෝගයෙන් සිටිනවා. කෝවිඩ් වසංගතය හේතුවෙන් කණගාටුදායක ලෙස

වසර කිහිපයකට මේ ක්‍රියාකාරකම් අත්හිටුවී තිබුණත් මාස කිහිපයකට කලින් සෙනෙට් සභාවේ විදේශ සබඳතා කමිටුවෙන් ධූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියා. ඉදිරි මාසවලදී කාර්යමණ්ඩල සාමාජිකයින් මෙන්ම කොංග්‍රස් සභිකයින් ද ඇතුළුව තවත් ධූත පිරිස් ඉදිසි මාසවලදී පැමිණෙනැයි අපි අපේක්ෂා කරනවා. එමෙන්ම, එක්සත් ජනපදයට යන පාර්ලිමේන්තු අධ්‍යයන චාරිකා නැවතත් ආරම්භ කරන්නටත් අපි උනන්දුවෙන් සිටිනවා.

U.S. House Democracy Partnership කියන්නේ අප දෙරටේ ව්‍යවස්ථාදායකයන් අතරේ ඵලදායී හුවමාරු සඳහා වන ඉතාමත් මාහැඟි වේදිකාවක්. ශ්‍රී ලංකාව 2016 දී ඊට සම්බන්ධ වූ තැන් පටන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සහ කාර්යමණ්ඩලය සමගින් විවිධ කටයුතු සඳහා සම්බන්ධ වී තිබෙනවා. ඊට කොංග්‍රස් මණ්ඩලයේ සාමාජිකයින් පිරිසක් පැමිණීමත් ඊට ඇතුළත්. මේ හවුල්කාරීත්වයට ශ්‍රී ලංකාව සක්‍රියව සම්බන්ධවීමට දැන් කාලය එළඹ තිබෙනවා. මෙම වේදිකාව සහ අනෙකුත් හුවමාරු මුලපිරීම් හරහා, පර්යේෂණ සහ අධීක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම වැනි ක්ෂේත්‍රවල කොන්ග්‍රසයේ අත්දැකීම් වලින් පාර්ලිමේන්තුවට ප්‍රතිලාභ ලැබිය හැකියි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් සහ දේශපාලන පක්ෂවල විවිධ අදහස් පිළිබිඹු කරමින් ප්‍රතිපත්ති සම්පාදනයේදී  පාර්ලිමේන්තුව මුහුණ දෙන අවස්ථා සහ අභියෝග පිළිබඳව අපගේ කොංග්‍රසයට ද ඉගෙන ගැනීමට බොහෝ දේ තිබෙනවා.

ශ්‍රී ලංකා-එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය යනු මේ සියළුම අවස්ථා සම්බන්ධයෙන් සහ තවත් දේවල් සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකි

වේදිකාවක් වනු ඇතැයි සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ තානාපති කාර්යාලය මෙන්ම වොෂින්ටනයේ නිලධාරීන් අතරේ තව තවත් සම්බන්ධතා යා කිරීමට මාර්ගයක් වනු ඇතැයි මා බලාපොරොත්තු වනවා. අද දින ගත් මේ ආරම්භයට මා සුභ පතන අතර සංගමයේ ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳ මා උද්යෝගයෙන් පසුවනවා.



SENSITIVE BUT UNCLASSIFIED